කුරුණෑගල රෝහල් අධ්‍යක්ෂ වෛද්‍ය සරත් වීරබණ්ඩාර සමගින් සිදුකෙරුණු සම්මුඛ සාකච්ඡාවක් දිවයින පුවත්පතේ පසුගිය දිනක පළවී තිබිණි. මෙහි සම්මුඛ සාකච්ඡාව සිදුකරනු ලැබූ හෝ ලියනු ලැබූ මාධ්‍යවේදියෙකුගේ නමක්ද පළවී නැති බවද නිරීක්ෂණය කරන්නට හැකි විණි.

මෙම සාකච්ඡාව ආරම්භ වී තිබුණේ, "පසුගිය ආණ්ඩුවේ අවසන් කාර්තුවේ රටේ විශාල ආන්දෝලනයක් ඇති කරන්නට සමත් වූ සිදුවීමක් වූ 'වෛද්‍ය සාෆි' සම්බන්ධ සිදුවීමේදී මවුවරුන්ට සිදුවූ අසාධාරණයක් වෙනුවෙන් විශාල සටනක් ගෙන ගියේ රෝහල් අධ්‍යක්ෂ වෛද්‍ය සරත් වීරබණ්ඩාර මහතා" බව පවසමිනි.

මෙහිදී පාඨකයින් ලෙසට අපට මෙම සම්මුඛ සාකච්ඡාව සම්බන්ධයෙන් යම් යම් නිරීක්ෂණයන් කිහිපයක් සිදුකළ හැක. දිවයින පුවත්පත මගින් අනාවරණය කර, පුළුල් ප්‍රචාරයක් ලබාදුන් වෛද්‍ය සාෆිගේ සිදුවීමේදී වෛද්‍ය වීරබණ්ඩාර ඉස්මතු විණි. මෙම සම්මුඛ සාකච්ඡාව පළ වන්නේ රට මහ මැතිවරණයකට සූදානම් වෙමින් තිබියදී වන අතර, වෛද්‍ය වීරබණ්ඩාරද ඊට නාමයෝජනා ලබාගැනීමට සූදානම්ව සිටින බව සම්මුඛ සාකච්ඡාවේ සඳහන් කරයි.

මාධ්‍යකරණයේදී විවෘත භාවය සහ වගවීම සමගින් පැමිණෙන පාරදෘෂ්‍ය භාවය යනු ආරක්ෂා කළ යුතු ජනමාධ්‍ය ආචාර ධර්මයක් ලෙසින් දැක්වෙයි. නමුත් මෙම සාකච්ඡාව පාරදෘෂ්‍ය යැයි අපට ගණන් ගත හැකිද? මෙහිදී විශේෂයෙන්ම සාකච්ඡාව සිදුකළ සහ/හෝ පළ කළ මාධ්‍යවේදියෙකුගේ හෝ මාධ්‍යවේදීන්ගේ නම් නොමැතිව පළව ඇති මෙම ලිපිය සඳහා දිවයින සංස්කාරක මණ්ඩලය සාමූහික වගකීමක් දරන්නේද? දිවයින පුවත්පත දිගින් දිගටම මේ සම්බන්ධයෙන් සිදුකළ වාර්තාකරණයත්, මෙය තවමත් රටේ නීතිය ඉදිරියේ විසඳා අවසාන වී නොමැති ගැටළුවක්ය යන්නත් එක්ව ගෙන බැලූ විට, අදාළ වෛද්‍ය සාෆි හට සහ එවකට මෙම පරීක්ෂණය භාරව සිටි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හට සෘජුවම චෝදනා එල්ල කරනා මෙම සාකච්ඡාව පළ කිරීම කෙතරම් ජනමාධ්‍ය ආචාර ධර්මයන්ට අනුකූල වේද? එම කරුණු සඳහන් කරන්නට යෙදුණේ වෛද්‍ය වීරබණ්ඩාර බව සැබෑ වුවත්, ලිපිය පළ කරනා දිවයින පුවත්පතටද එහි වගකීම නොපැවරෙන්නේද? මේ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?

#MediaEthicsSL #Ika #SinhalaPress #News #Divaina